# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1248 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br><br>Date | 04/10/2023<br>පැය 1420 |

## මාධ්‍ය නිවේදනය

**01.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - හෝමාගම පොලිස් ස්ථානය.**

2023.10.03 වන දින සවස් කාලයේ හෝමාගම පොලිස් වසමේ උඩුවන හන්දියේදී සහ පින්කෙත හන්දියේදී හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීම් 02 ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 250 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 39 හා 45 වයස්වල පසුවන හෝමාගම හා අතුරුගිරිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**02.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සූරියපුර පොලිස් ස්ථානය**

2023.10.04 වන දින අළුයම් කාලයේ සූරියපුර පොලිස් වසමේ මහවැලි ගඟ අසල ජල පොම්පාගාරය අසලදී සූරියපුර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.
**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වූ දෙහිවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** සූරියපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - රස්නායකපුර පොලිස් ස්ථානය

2023.10.03 වන දින සවස් කාලයේ රස්නායකපුර පොලිස් වසමේ මොන්නැකුලම ප්‍රදේශයේ නිවසකදී රස්නායකපුර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වූ මොන්නැකුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** රස්නායකපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 04. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාමක් - පන්විල පොලිස් වසම.

2023.10.03 වන දින සවස් කාලයේ පන්විල පොලිස් වසමේ ප්‍රධාන වීදියේ පිහිටි නිවසක් තුල පුද්ගලයෙකු විදුලි සැර වැදී මියගොස් ඇති බවට පන්විල පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක්වූ ප්‍රධාන වීදිය, පන්විල ලිපිනයේ තාවකාලිකව පදිංචිව සිට ඇත.**

මරණකරු විදුලි අලුත්වැඩියා කටයුත්තක් සිදුකරමින් සිටියදී මෙලෙස මියගොස් ඇත. මෘත ශරීරය සම්බන්ධව හදිසි මරණ පරීක්ෂණය සිදුකර තෙල්දෙණිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පන්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. රිය අනතුරක් - බේරුවල පොලිස් වසම.

2023.10.03 වන දින රාත්‍රි කාලයේ බේරුවල පොලිස් වසමේ ගාල්ල කොළඹ මාර්ගයේ බේරුවල නගරයේදී කතරගම සිට කොළඹ දෙසට ධාවනයවූ ලංගම බස් රථයක් වෙනත් වාහනයකට ඉස්සර කිරීමට යාමේදී ඉදිරියෙන් පැමිණි සුඛෝපභෝගී බස් රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් සුඛෝපභෝගී බස් රථයේ රියදුරු ඇතුලු 06 දෙනෙකු තුවාල ලබා බේරුවල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කළුතර නාගොඩ රෝහල වෙත ඇතුලත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලංගම බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. බේරුවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**